# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1799/7 – 2013 පෙබරවාරි 27 වැනි බදාදා – 2013.02.27

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡේදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: අයිආර්/22/26/2011.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කරුණ පිළිබඳව–

ඒ. ඩී. ඒ. අමරසිංහ මහතා, අංක 321 - ඩී - 3, කල්දේරම් මඩුවත්ත පාර, වෑකඩ, පානදුර

සහ

සීමාසහිත කන්තලේ සීනි කර්මාන්තායතනය, අංක 55/75, ජන.ව.ස.ම. ගොඩනැගිල්ල, වොක්ෂෝල් වීදිය, කොළඹ 02.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින්ද,

කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍ය ගාමිණී ලොකුගේ වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්,

පිලියන්දල, නාම්පමුණුව, කුමුදු මාවත, අංක 89/Fහි සුනෙත් ලොකුබෝගහවත්ත මහතා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**ගාමිණී ලොකුගේ,**
කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍ය.

2013 පෙබරවාරි මස 18 වැනි දින,
කොළඹ දී ය.

---

1A – G 17349 – 380 (2013/02)

මගේ අංකය: අයිආර්/22/26/2011.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

ඒ. ඩී. ඒ. අමරසිංහ මහතා, අංක 321 - ඩී - 3, කල්දේරම් මඩුවත්ත පාර, වෑකඩ, පානදුර

සහ

සීමාසහිත කන්තලේ සීනි කර්මාන්තායතනය, අංක 55/75, ජන.ව.ස.ම. ගොඩනැගිල්ල, වොක්ෂෝල් වීදිය, කොළඹ 02.

ඉහත පාර්ශ්වයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ,

සීමාසහිත කන්තලේ සීනි කර්මාන්තායතනයේ ආරක්ෂක නිලධාරියෙකු වශයෙන් සේවයේ නියුතුව සිටි ඒ. ඩී. ඒ. අමරසිංහ මහතා හට වයස අවුරුදු පනස් හත (57) දක්වා සේවය කිරීමට තිබූ අවස්ථාව අහිමි කරමින් වයස අවුරුදු පනස් තුනේ දී (53) විශ්‍රාම ගැන්වීම යුක්ති සහගතද යන්න හා එසේ නොවන්නේ නම් ඔහුට ලැබිය යුතු සහනයන් මොනවාද යන්න පිළිබඳව වේ.

**වී. බී. පී. කේ. වීරසිංහ,**
කම්කරු කොමසාරිස්.

2013 පෙබරවාරි මස 08 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

03 – 629

---

මගේ අංකය: IR/20/13/2008.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කරුණ පිළිබඳව–

අන්තර් සමාගම් සේවක සංගමය, අංක 12/2, වීර මාවත, ශ්‍රී සුභූතිපුර, බත්තරමුල්ල, (ඩී. ආර්. යූ. ජේ. වීරසේකර මහතා වෙනුවෙන්)

සහ

පැල්වත්ත ෂුගර් ඉන්ඩස්ට්‍රීස් ලිමිටඩ්, අංක 27, මෙල්බර්න් ඇවනිව්, තැ.පෙ. 1992, කොළඹ 04.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින්ද,

කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍ය ගාමිණී ලොකුගේ වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්,

බත්තරමුල්ල, පන්නිපිටිය පාර, අංක 77හි, ටී. පියසෝම මහතා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**ගාමිණී ලොකුගේ,**
කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍ය.

2013 පෙබරවාරි මස 18 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/20/13/2008.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

අන්තර් සමාගම් සේවක සංගමය, අංක 12/2, වීර මාවත, ශ්‍රී සුභූතිපුර, බත්තරමුල්ල, (ඩී. ආර්. යූ. ජේ. වීරසේකර මහතා වෙනුවෙන්)

සහ

පැල්වත්ත ෂුගර් ඉන්ඩස්ට්‍රීස් ලිමිටඩ්, අංක 27, මෙල්බර්න් ඇවනිව්, තැ.පෙ. 1992, කොළඹ 04.

ඉහත පාර්ශ්වයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ** වනුයේ,

සීමාසහිත පැල්වත්ත සීනි කර්මාන්තායතනයේ P 2 ශ්‍රේණියේ කාර්මික ශිල්පියෙකු ලෙස සේවය කරන ඩී. ආර්. යූ. ජේ. වීරසේකර මහතාට 2007.01.01 දින සිට P 1 ශ්‍රේණියට උසස්වීම් නොලැබීමෙන් ඔහුට යම් අගතියක් සිදුවුනිද? එසේ වූයේ නම් ඔහුට කුමන සහනයක් හිමිවිය යුතුද යන්න වේ.

**වී. බී. පී. කේ. වීරසිංහ,**
කම්කරු කොමසාරිස්.

2012 ජූලි මස 02 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

03 – 630

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.